කතෝලික විශ්වාසය තුළ

චාතරික වන්දනාව සහ ජාතික සාමූහිකත්වය

අපේ කතෝලික සම්ප්‍රදාය අනුව චාතරික සමයේදී ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ දුක්ප්‍රජ්තිය සහ මරණයද, පාස්කුව තුළ එතුමන්ගේ උත්තානයද අපි සිහි කරමු. චාතරික සමය යනු අළු බදාදා දිනෙන් පටන්ගෙන, දින සතලිසක් පුරාවට ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ දුක්ප්‍රාප්තිය, නිදා වර්ජනය, මල් උයනේදී යාච්ඤා කිරීම සහ උන්වහන්සේගේ මරණය සිහි කරන කාලයයි. කතෝලිකයන් වශයෙන් අපි මෙම සමයේදී බොහෝ චාරිත්‍රානුකූල පිළිවෙත් අනුගමනය කරන්නෙමු. ඒ පිළිවෙත් සමහරක් නම් පාදනමස්කාරය, එක්වරද ශීල රැකීම, ගොඩ් ඉරිදා චාරිත්‍ර, මහා සිකුරාදා පිළිවෙත් ආදියයි. මෙම පිළිවෙත් අනුගමනය කිරීමේදී වඩාත් වැදගත් වනුයේ අප ඉන් ආත්මික පෝෂනයක් ලබනවාද යන්නයි. කතෝලික සංගයක් වශයෙන් ආත්මික පෝෂණයක් ලැබීමට නම් අවසානයේ උත්ථානය වූ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළ නව ජීවනයක් ලබන්නටත් හැකිවන ආකාරයේ සංවිධානයක් විය යුතුය. එසේ නෙයින් මෙවන් ආකාරයේ සංවිධානයක් කිරීම පහසු කාර්යක් නොවන බව අවිවාදයෙන් පිළිගත යුතුවේ. මේ ආකාරයේ අසීරු උත්සහයකදී තමන්ගේ හැකියාවන්, උදාහරණ වශයෙන් කෙනෙකුගේ ශ්‍රමය, සිතීමේ හැකියාවන්, දේශනා කිරීමේ හැකියාවන් මිල මුදල් සහ මෙවන් අවස්ථාවලට සහභාගී වීමට කාළය මිඩංගු කිරීම දෙවියන්ගේ ගිනිය තුළ මිස අන් කිසිදු මනුෂ්‍ය හැකියාවන් තුළ කල නොහැකිය යන්න පැවසීම අතිශෝක්තියක් නොවේ. මෙල්බර්න් නගරය ආශ්‍රිතව වෙසෙන කතෝලික සංගයට ආත්මික පිබිදීමක් ලබා දීමේ අටියෙන් ඕස්ට්‍රේලියා - ශ්‍රී ලංකා කතෝලික සංගමය විසින් පසුගිය චාරිත කාළය තුළ ආගමානුකූල වත්පිළිවෙත් සමූහයක් සංවිධානය කරනු ලැබිණ. එසේ පණගැන්වුනු ආත්මික වටිනාකමකින් යුත් අවස්ථා කීපයක මතක සටහන් ඔබ හමුවේ තැබීමට ගන්නා උත්සහයක ප්‍රතිඵලයක් ලෙස මේ ලිපිය එළිදක්වන්නේ.

අපගේ චාතරික වන්දනා ගමන ආරම්භ වූයේ පසන් ගී සහ දිව්‍ය සත්ප්‍රසාද වන්දනාවකිනි. මෙම ශුද්ධ වූ අවස්ථාව මෙහෙය වූයේ ගරු කර්ල්ටන් ඩී සිල්වා පියතුමා වන අතර ඊට සහභාගී වූ කතෝලික නොවන අයගේ පවා ප්‍රතිචාර වූයේ එම පසන් ගී මෙහෙ තුළින් ඉදිරිපත් වූ, මුළු මනුෂ්‍ය සංහතියේ ගැළවීම උදෙසා ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ විදි දුක් ඉතා සිත් කාවදින ආකාරයෙන් ඉදිරිපත් වූ බවයි. අප මව් බිමෙන් ඈත්ව ජීවත් වන අපට ඇත්ත වශයෙන්ම එම පසන් ගී සැදැව දෙවියන් හා සමග අර්ථවත් භාවනාවක සම වැදීමට උන්වහන්සේගේ මරණය සහ දුක් ප්‍රාප්තිය සිහිකරනන මේ චාතරික සමය තුළ මහඟු අවස්ථාවක් විය. මෙම භාවනාත්මක පැයේදී සංගයක් ලෙස සහභාගී වූ අපි සැම දෙවියන් තුළ මෙත්වය නිසා අප සිත් තුළට කිදා බැස තිබූ පාපිතර ජීවිත වලට නැවතීමේ ලකුණ තැබීමට අදිටන් කරගෙන අන්ධකාරයේ මාවත අතහැර දෙවියන් තුළ ආලෝකයේ මන්පෙත වෙත නව ජීවනයකින් ප්‍රවිෂ්ඨ වූයෙමු.

චාතරික වන්දනාවේ මීළඟ මං සළකුණ වූයේ .ධර්ම බිහ දය ජසබම සැබළුරු ඊජජයම් ඊරිය. පැවැත්වුණු අර්ථවත් ගොඩ් ඉරිදා මෙහෙයයි. දේව මෙහෙයට ප්‍රථමයෙන්, ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ කුරුසිය කර පින්නාගත් කල්වාරි ගමන සිහි කරමින් පැවැත්වුනු පශ්චත්ථාපික පාදනමස්කාරය විශාල ජන සමූහයක සහභාගිත්වයෙන් පැවැත්විය. ඉන්පසුව ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ජෙරුසිලමට ජයග්‍රාහි ඕලාවෙන් ප්‍රවිෂ්ඨ වූ ගමන සිහි ගන්වමින් පියතුමා පෙරටුව පාමි අතු අතැතිව ජයඝෝෂා ගීතිකා ගයමින් ගොඩ් ඉරිදා දේව මෙහෙය සැමරීමට අපි සැම දේවස්ථානය කරා එක් රොක් වූයෙමු. මෙම අර්ථවත් මෙහෙය පැවැත්වූයේ ගරු. ක්‍රිශාන්ත ජයලත් පියතුමාගේ ප්‍රධානත්වයෙනි. මෙම ගොඩ් ඉරිදා මෙහෙය සහ පාදනමස්කාරය සංවිධානය කිරීමේ කටයුතු මෙහෙය වූයේ රුක්මල් මෙන්ඩිස් මහතා සහ එල්මෝ ක්‍රෂත් මහතා විසිනි.

අපගේ මෙම චාතරික වන්දනාවේ මීළඟ සංදිස්ථානය වූයේ මහා බ්‍රහස්පතින්දා මෙහෙයයි. කතෝලිකයින් වශයෙන් මහ බ්‍රහස්පතින්දා අප සිහකරනුයේ අප සඳහා පිහිටුවීම පිළිබඳ වැදගත් අවස්ථා තුනක් සමරමිනි. එමෙවැදගත් අවස්ථා තුන නම්: 1. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ අන්තිම රාත්‍රී භෝජන තුළ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ප්‍රථම වරට ස්ථාපිත කිරීම, 2 ජේසුස් ක්‍රිසිතුස් වහන්සේ ගෝලයන්ගේ පාද දෝවනය සංකේතාත්මක කරමින් කතෝලික සභාවේ පූජාත්වරයේ බැගෑපත්තම සිහිකිරීම, 3. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේව සතුරාට පාවාදීම සහ උන්වහන්සේගේ දුක් ප්‍රාප්තිය සහ මරණය සිහිකිරීම යන අවස්ථා වේ. ඔස්ට්‍රේලියා - ශ්‍රී ලංකා කතෝලික සංගමය විසින් ඉහත සඳහන් වූ කතෝලික සභාවේ වැදගත් අවස්ථා සිහි කරමින් සංවිධානය කරන ලද මහා බ්‍රහස්පතින්දා මෙහෙය විශාල ජන එකතුවීමක් සමග සිසු සැබළුරු සෑදීබඳ. ගිදි පැවැත්වීණ, මහා බ්‍රහස්පතින්දා මෙහෙයෙන් පසුව ජේසුස් වහන්සේ සතුරන් අතට තමා සමග අන්තිම රාත්‍රී භෝජනය වැළඳූ ගෝලයකු අතින්ම පාවා දීම සිහිකරමින්ද උන්වහන්සේගේ දුක් ප්‍රාප්තිය සිහිකරමින්ද කරන ලද භාවනාත්මක ශුද්ධ වූ පැයක් ඉතාමත් චිත්ත පිබිදීමක් ඇතිකරවන ආකාරයෙන් පැවැත්විණ. මෙම ආත්මික වැදගත්කමකින් යුතු වත් පිළිවෙත් ඉෂ්ට සිද්ධ වූයේ ගරු ක්‍රිශාන්ත ජයලත් පියතමගේ මෙහෙයවීමෙනි.

මෙසේ දිග හැරෙමින් යන අපගේ චාතරික වන්දනාව, මීළඟ මන් සළකුණු සනිටුහන් කරමින් පස්වන වරටත් ඕස්ට්‍රේලියා-ශ්‍රී ලංකා කතෝලික සංගමය විසින් සංවිධානය කරන ලද ජන වන්දනාව -ස්කති ඊව, ගිදි පැවැත්විණි. මෙගිදී, මහ සිකුරාදා ජන වන්දනාව ආරම්භ කරමින් අර්ථවත් පාද නමස්කාරයක් ගරු, ක්‍රිශාන්ත ජයලත් පියතුමාගේ මෙහෙයවීමෙන් විශාල ජන ගංගාවකගේ සහභාගිත්වයෙන් පැවැත්විණ. මෙසේ දුර බැහැර ගෙවා නේවාසිකව, ජන වන්දනාවට සහභාගී වන මෙල්බන් නගරයේ සතර දෙසින් පැමිණි සැදැහැවතුන් වෙනුවෙන් බාල මහලු සැමටම සහභාගී වීමට අවස්ථාවන් උදා කරමින් විශේෂ වැඩ පිළිවෙළවල් කිහිපයක් පැවැත්විණ. එම වැඩ පිළිවෙල් සමහරක් නම් - ජේසු හඳුනා ගැනීම- නමින් අවු 12 පහළ දරුවන්ගේ ක්‍රියාකාරකමක්ද, වැඩිහිටියන්ට 'දුක් විඳීම සහ සුවය ලැබීම' සහ 'කතෝලික විශ්වාසය තුළ දුක් විඳීම සහ සුවය ලැබීම' යන තේමාවන් යටතේ පැවැත්වූ දේශන ඇතුළු සාකච්ඡාවන්ද, ගරු, ක්‍රිශාන්ත ජයලත් පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. තවද තරුණ තරුණියන් සඳහා යාඥා වැඩමුළුවක්ද, තරුණ ඕස්ට්‍රේලියා-ශ්‍රී ලංකා කතෝලික සංගමය මගින් ඉතා කාලෝචිත ආකාරයෙන් සංවිධානය කර තිබිණ.

අළේලුයියා සෙනසුරාදා අළුයම අරුණාලු සමග ළඟි ළඟියේ, කැඳවුරු බැඳ සිටි අපි සැවොම එක් සිත්ව, එක්රොක්ව තොරන් බැඳ සූදානම් වූයේ හලාවත පදවියේ ඇති උතුම් වැළෙන්සි මෙන්ඩිස් රද ගුරු හිමිපාණන් පිළිගැනීමටයි. ශ්‍රී ලංකාවේ සිට ඕස්ට්‍රේලියාව කරා පැමිණ, ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානය සිහිකරමින්, අන්ධකාරයේ යුගයක නිමාව දැකිමින්, ආලෝකය රප කරන මං පෙනක් කරා යන ගමන සළකුණු කරන පාස්කු මංගල්‍යය සැමරීමට අප හා එක්වුනු අති උතුම් වැළෙන්සි මෙන්ඩිස් රදගුරු හිමිපාණන්ගේ සම්ප්‍රාප්තිය, දහම් පිපාසිත බැටළු කැළක් වූ මෙල්බර්න් වාසිය අප සැමට යහපත් එඩ්ඩරෙකුගේ ආරක්ෂාවක් බඳු විය. අති උත්කර්ෂවත් අයුරින් අළේලුයියා සෙනසුරාදා සැදෑ මෙහෙය අති උතුම් වැළෙන්සි මෙන්ඩිස් රදගුරු හිමිපාණන් සහ ගරු, ක්‍රිශාන්ත ජයලත් පියතුමාගේ මෙහෙයවීමෙන් පැවැත්වුණු බවට සහභාගී වුණු සියල්ලෝ සාක්ෂි දරණු ඇත. අළේලුයියා සෙනසුරාදා සැදෑ මෙහෙය, කිසිදු කතෝලික වත් පිළිවෙතක් අත් නොහැරම පැවැත්වුණු අතර, මෙහෙය ආරම්භ වූයේ අළුත් ගින්දර සහ ජලය ආසිර් කන්වමිනි. සහභාගී වුණු සැදැහැවතුන් සියල්ලෝම නව ගින්නෙන් දල්වා ගත් ඉටි පහන් රැගෙන අති උතුම් වැළෙන්සි මෙන්ඩිස් රදගුරු හිමිපාණන් සහ ගරු, ක්‍රිශාන්ත ජයලත් පියතුමා පෙරටුව පෙරහැරකින් දේවස්ථානය කරා ගමන් ගැනීමෙන්



අනතුරුව, ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ අත්ථානය සිහිකරමින් එම ස්වර්ගික මංගල්‍යය සැමරින. මරණය පරාජය කරමින්, උත්ථානය වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ආශිර්වාද ලබා ගත් අපි සැවොම එම ප්‍රිතිමත් රාත්‍රියේදී ප්‍රණීත භෝජන සංග්‍රහයකට සහ මියුරු සංගීත සැදැවකට සහභාගී

38 වන පිටට